# Path to Success – Study Pack

තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# නාට්‍ය හා රංගකලාව
# 6 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනී කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
කේ. ඒ. එස්. පී. ගුණරත්න - ගුරු සේවය
එම්. වී. ප්‍රභා කුමාරි මීගොඩ - ගුරු සේවය

**සියලු හිමිකම් ඇවිරිණි**

## අභිනය හඳුනා ගනිමු.

අභිනය යනු සංස්කෘත වචනයකි. මෙහි සිංහල අරුත වන්නේ "ඉදිරියට ගෙන යාම " නැතහොත් ඉදිරියට ගෙන හැර පෑම යන්නයි.

නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කරන මාධ්‍යය අභිනය ලෙස හඳුන්වනු ලබයි. මෙම සංකල්පය ඉදිරිපත් කළේ ක්‍රි.පූ. 03 වන සියවසේ ජීවත් වූ භරත නම් මුණිවරයායි. ඔහුට අනුව අභිනය වර්ග 04කි.

1. ආංගික අභිනය
2. වාචික අභිනය
3. සාත්වික අභිනය
4. ආහාර්යය අභිනය යන්නයි.

**ආංගික අභිනය**

නාට්‍යයක විවිධ අවස්ථා නිරූපණයේ දි නළු නිලියන් තමන්ගේ ශරීරාංගයන්ගෙන් සිදුකරන ක්‍රියා ආංගික අභිනයට අයත් වේ. උදාඃ ඇවිදීම, අත වැනීම, සවන් අල්ලා ගැනීම ආදිය

**වාචික අභිනය**

නළු නිලියන් තමන්ගේ කටහඩ යොදාගෙන කරනු ලබන ප්‍රකාශනයන් වාචික අභිනයට අයත් වේ. දෙබස් කීම, සංවාද, ගීත ගායනා මෙයට උදාහරණ වේ.

**සාත්වික අභිනය**

නළු නිලියන්ගේ සිතේ ඇතිවන හැඟීම් මුහුණින් ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි. නිදසුන් ලෙස හැඩීම, සිනාසීම, වේදනාව, බය, දහදිය දැමීම, වෙව්ලීම, මුහුණ රතු වීම ආදිය වේ.

**ආහාර්යය අභිනය**

නාටයයක් සඳහා පිටතින් එක් කරනු ලබන ඇඳුම් පැළඳුම්, අංගරචනා, ආලෝකය, සංගීතය, පසුතල ආදි සියල්ල ආහාර්යය අභිනයට අයත් වේ.

**පැවරුම**

1. අභිනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

2.අභිනය වර්ග 04ක් නම් කරන්න.

3.වේදිකා නාට්‍යවල රූප සටහන් එක්රැස් කරන්න.

4.ඔබ දන්නා වේදිකා නාට්‍ය ගීතයක් අභිනය යොදා ගනිමින් ඉදිරිපත් කරන්න.

# මුහුණු සාදමු

අතීතයේ සිටම අපේ ජන නාට්‍ය හා ශාන්ති කර්ම සඳහා විශේෂයෙන්ම සකස්කර ගන්නා ලද වෙස් මුහුණු වර්ග විශාල සංඛ්‍යාවක් දක්නට ලැබුණි. වෙස් මුහුණු තැනීම සඳහා බරින් අඩු රුක් අත්තක, ගොඩ කඳුරු, වෙල් කඳුරු, සමදරා වැනි ලී වර්ග භාවිත කරන ලදි.

නළුවකුට බාහිර සමාරෝපණයේදි වෙස් මුහුණු පැළඳීම සිදුකල හැකිය. බොහෝ විට නාට්‍ය වල එක සත්ව චරිත, දේව චරිත, මනඃකල්පිත චරිත සඳහා වෙස් මුහුණු භාවිතා කිරීම සිදු කරයි. නරි බෑනා නාට්‍යයේ නරියාටත්, එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයේ අශ්වයාටත් මෙවැනි වෙස් මුහුණු යොදා ගනු ලබයි.

අපට සරල වෙස් මුහුණක් තැනීම සඳහා පරිසරයෙන් ලබාගත හැකි කොල වර්ග රාශියක් ඇත. එනම් පුවක් කොළපත්, තේක්ක කොළ, පර කොළ (දියපර කොළ) , පොල් මටලු, උණ කොළපු, ගං දෙල් කොළ ඉන් කිහිපයකි.

වෙස් මුහුණු තැනීමේදි පහත කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුයි.

- වැඩි වියදමකින් තොර විය යුතුය.
- පරිසරයෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය පාවිච්චි කළ යුතුය.
- පැළඳීමට හැකිවන ලෙස සකස් කළ යුතුය.
- කල්පවත්නා ලෙස සැකසීමට වගබලා ගත යුතුය.
- රංගනයට බාදා නොවන ලෙස සකස් කළ යුතුය.



එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයේ අශ්වයා





ලීයෙන් කරන ලද නිර්මාණ





**පැවරුම**

1.ඉවතලන ද්‍රව්‍ය වලින් සරල වෙස් මුහුණක් නිර්මාණය කරන්න.

2.වෙස් මුහුණුවල රූප එක් රැස් කරන්න.

3.ඔබ නිර්මාණය කළ වෙස් මුහුණ පැළඳ ඊට ගැලපෙන චරිතයක් නිරූපණය කරන්න.

## වළලු මාල මුදු කරාබු ඔටුනු අපිම සාදා පළඳා අපි රගමු.

නාට්‍යයක නළු නිලියන්ගේ රංගනය සඳහා භාවිතා කරන විවිධ පැළඳුම් අයත් වන්නේ ආහාර්යය අභිනයටය. මාල, වළලු, මුදු, කරාබු, නලල්පටි, ඔටුනු, ඉනපටි ආදි වූ විවිධ ආභරණ වර්ග මෙයට අයත් වේ. වේදිකා නාට්‍යයක නළු නිලියන් සඳහා ආභරණ තැනීමේදි පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

1. නාට්‍යයේ චරිතයට ගැලපිය යුතුය.
2. ප්‍රමාණයෙන් විශාල විය යුතුය.
3. වර්ණවත් විය යුතුය.
4. කල් පැවතිය යුතුය.
5. පහසුවෙන් පැළඳිමට හා ගැලවීමට හැකිවිය යුතුය.
6. රංගනයේදි බාධා නොවිය යුතුය.



පන්ති කාමරයේ දි ආභරණ නිර්මාණයේ දි අපට භාවිත කළ හැකි අමුද්‍රව්‍ය ගණනාවක් ඇත. ඒ සඳහා ඔලිඳ ඇට, රබර් ඇට, කිරිඳි ඇට, සියඹලා, දොඹ, පුස් ඇට, මදටිය ආදි ඇට වර්ග හා නූල්, ඉඳිකටු, කම්බි, ගම්, ලැකර් වර්ග ආදි අමුද්‍රව්‍ය අවශ්‍ය වේ.







**පැවරුම**

- ඔබ කැමති අමුද්‍රව්‍යයක් යොදා ගෙන රජ බිසවකට සුදුසු මාලයක් නිර්මාණය කරන්න.
- එය නිසිලෙස වර්ණ ගන්වන්න.
- වේදිකා නාට්‍යවල ආභරණ පැළඳි රජ කුමාරවරුන්ගේ හා කුමරියන්ගේ රූප එක්රැස් කර පොතේ අලවන්න.
- මනමේ නාට්‍යයේ ගීත අන්තර්ජාලයෙන් නරඹා ඒවායේ ආභරණ පිළිබඳ අවබෝධය ලබාගන්න. ගී රස විඳින්න.

## ජනකතා ඇසුරින් සරල නාට්‍ය පෙළක් රචනා කරමු.

ඔබ කුඩා කාලයේ සිටම විවිධ වර්ගයේ ජනකතා රසවිඳ ඇත. මෙම ජනකතා ඇසුරින් නිර්මාණය වූ වේදිකා නාට්‍ය ගණනාවක් ද අපට රස විඳීමට ලැබී ඇත. දයානන්ද ගුණවර්ධන මහතාගේ නරි බෑනා නාට්‍යයත්, සෝමලතා සුබසිංහ මහත්මියගේ තොප්පි වෙළෙන්දා නාට්‍යයත් ඉන් කිහිපයකි.

අප රසවිඳි ජනකතා සියල්ලම වේදිකා නාට්‍යයක් නිර්මාණය කිරීමට සුදුසු නැත. ඒවායින් නාට්‍යයෝචිත අවස්ථා සහිත ජනකතාවක් අපූර්ව ආකාරයෙන් අපට නාට්‍යයක් ලෙස සකස් කල හැකිය.




නරි බෑනා නාට්‍යය





තොප්පි වෙළෙන්දා නාට්‍යය

**පැවරුම**

- පහත සඳහන් ජනකතා ඇසුරින් සංවාද සහිතව (කුඩා කණ්ඩායමක් ලෙස එක් වී රංගනය කල හැකි වන අයුරින්) නාට්‍ය පිටපතක් සකසන්න.
    1. ගමරාල දිව්‍ය ලෝකේ ගියා වගේ
    2. පුහුල් හොරා කරෙන් දැනේ
    3. අබරං සිල් ගත්තා වගේ
    4. පරංගියා කෝට්ටේ ගියා වගේ
- පහත දැක්වෙන නාට්‍ය රසවිඳින්න.( නාට්‍ය පිටපත් හෝ CD පට මගින්)
    1. රතු හැට්ටකාරි
    2. තොප්පි වෙළෙන්දා
    3. නරි බෑනා
    4. එලොව ගිහින් මෙලොව ආවා

## නාට්‍ය නිෂ්පාදනය රස විඳියි.

පුංචි අපට දුන් තේරෙයි නාට්‍ය ළමා වේදිකා නාට්‍යයකි. මෙය නිර්මාණය කරන ලද්දේ සෝමලතා සුබසිංහ මහත්මිය විසිනි.

පහත දී ඇති නාට්‍ය පිටපත කියවා පහත සඳහන් පැවරුම් සම්පූර්ණ කරන්න.

### චරිතවලට බෙදී පෙළ හඩනගා කියවමු.

**පැවරුම**

- නාට්‍ය පෙළ පැහැදිලිව හා අර්ථවත්ව කියවා රසවිඳින්න.
- නාට්‍යයේ තේමාව ලියන්න.
- මෙහි ඇති සංවාද හා ගීත නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න.
- මෙම නාට්‍යයෙන් ජීවිතයට ලබාගත හැකි ආදර්ශ 04ක් ලියන්න.
- නාට්‍යයේ දක්නට ලැබෙන චරිත නම්කර ඒ චරිතවල ඇති සුවිශේෂී ගුණාංග 02 බැගින් ලියන්න.

### චරිත රගපෑමට පෙර සංවාද පුරුදු වෙමු.

**පැවරුම**

- පුංචි අපට දුන් තේරෙයි නාට්‍ය පිටපත හොඳින් කියවා රස විඳින්න.
- චරිත වලට අදාල පෙළ කොටස් තනිව උච්චාරණය කිරීමට පුහුණු වන්න.
- චරිත වලට ගැලපෙන ලෙස හඩ හසුරුවන්න.
- සංවාද භාවිතා කිරීමේදී සාත්වික හා ආංගික අභිනය යොදා ගනිමින් හැඟීම් ප්‍රකාශ කිරීමට උත්සාහ ගන්න.
- පුංචි අපට දුන් තේරෙයි නාට්‍යයේ ඇති චරිත සඳහා සුදුසු ඇඳුම් පැළඳුම් ඔබම සකසා ගන්න.ඊට ගැලපෙන අංග රචනාවක් ද යොදා ගන්න. (මේ සඳහා ඉවත දමන රෙදි/ කාඩ්බෝඩ් වැනි දෑ යොදා ගන්න.)

## පුංචි අපට දුන් තේරෙයි නාට්‍ය පිටපත

( මල් පාත්තිය මෙන් රගපාන ගායක පිරිස

අභිනය සහිතව වේදිකාව ඉදිරියට ගමන් කරමින්)

පුංචි කතාවක් කියන්න

පුංචි අපට සවන් දෙන්න

පුංචි පුංචි වැරදි ඇතත්

පුංචි අපට සමාවන්න

(ගායක පිරිස පසුපසට ගමන් කරමින්)

පුංචි අපේ කතන්දරේ

කුකුල් හාමි කෙනෙක් වෙතයි

මී හාමිලා හතරදෙනයි

වත්තේ මල් ගස් මෙ අපමයි

(කුකුල් හාමි එළියට එයි. මී හාමිලා හතර දෙනා දිව යයි. ගායක පිරිස මල් පාත්තිය මෙන් සිට ගනිති)

කුකුල් හාමිනේ

ගෙදර කොතැනදෝ?

කුකුල් හාමිනේ

ගෙදර මෙතැන වේ

වෙලාව කියනා

මූණ කොතැනදෝ?

වෙලාව කියනා

මූණ මෙතැන වේ

මල් පාත්තිය කොතැන තිබුණි?

මල් පාත්තිය මෙතැන තිබුණි

කතන්දරේ කොහොම වුණේ?

කතන්දරේ මෙහෙම වුණේ.

(කුකුල් හාමි වේදිකාව පසුපසින් ඉදිරියට එයි. තම රාජකාරී කටයුතු, ගෙදර දොරේ කටයුතු කෙරෙහි යුහුසුලු වන බව අභිරූපණය කරයි.)

ඈත එපිට ගම්මානෙක

උදෙන් නැගිට

බස බස ගා තටු විහිදා

කුක්කු කූ කුක් කියලා

ඉර පායන ආරංචිය

නොා වරදවා ගමට කියන

නියම වෙලාවට හඬලන කුකුලෙක් හිටියා

ඉර පායන ආරංචිය

මුදුනට එන ආරංචිය

ඉර බැස යන ආරංචිය

මුළු ගමටම කියා සිටින

රාජකාරී භාරකාර

කුකුල් හාමි හරි දක්සයි

කම්මැලිකම අගලක් නැති

වැඩට පළට හොඳට කැමති

හැම කෙනෙකුට හොඳ හිත ඇති

කුකුල් හාමි

තමන්ට ඇති රාජකාරී

ඉටු කරන්නේ හොඳ සතුටින්

(මී හාමිලා හතර දෙනා එහෙ මෙහෙ දුවති)

මී හාමිලා හතර දෙනයි

ඉන්ඩ තැනක් උන්ට නැතෙයි

කන්ඩ දෙයක් උන්ට නැතෙයි

බොන්ඩ දෙයක් උන්ට නැතෙයි

**1 වැනි මීයා** කිසිම දෙයක් ලැබුණේ නෑ
කුස්සි ගානේ ඇවිද්දා මං
දැන් ඉස්සර වගේ ගෙවල
වැඩිපුර කෑමක් නැනේ

**2 වැනි මීයා** මටත් නැනේ
මොකුත් ලැබුණේ
ගහක කොළක
පලතුරු නෑ
දලු කොළ නෑ
මිනිස්සු සූරාගෙන කාලා

**3 වැනි මීයා** මිදුලක විසිකරපු දෙයක්
කසළ ගොඩක
දාපු දෙයක්
අපි වාගේ අයට කන්න
නෑ දැන් ඉතුරුවත් වෙන්නේ

**සියල්ලෝම** හෝ හෝ ගාලා වැස්සක්
අඬු පුප්පා එන ඉස්සෙක්
දැන් දැන් මේ ළග එනවා
ගෙයක් සොයන්නට වෙනවා

**4 වැනි මීයා** ගෙයක් හදා ගත්තත් දැන්
ඇඳ ඇතිරිලි
කොට්ට මෙට්ට
හදා ගන්න ලේසි නැනේ
ඉස්සර වාගේ නෙව දැන්
මිනිස්සු හරි පිරිමැස්මයි

කඩමල්ලක් කඩදහියක්
ගෙදර දොරක
අපතෙ නොයයි
දැකල නැද්ද පුංචි පිරිමි ගැහැනු ළමයි?
පාර තොටක කඩදහියක්
ඉතිරි නොකර එකතු කරන් !

**1 වැනි මීයා** සංස්ථාවක් කියල තැනක
ලියන,කියන,අඳින,ඔතන
කඩදහි හදලා දෙනවලු
අහක දාන කඩදාසිත්
එතනට මිලයට ගනීලු.

**2 වැනි මීයා** ඉතිං මොකද දං කරන්නේ?

**1 වැනි මීයා** අහල නැද්ද එහා ගමේ
කුකුල් හාමිගේ විස්තර
අසරණ අපි වගේ අයට
උදව් දෙන්න හරි කැමතිලු

**සියල්ලෝම** එහෙනං අපි එහාට යමු
ගිහිං කුකුල් හාමි සොයමු
යමක් කමක් කරලා දීලා
ඉන්ට කන්ට
සොයා ගනිමු
(පිරිස ගායනා කරති. මීයෝ අභිරූපණය කරති)
නියර දිගේ
දුවගෙන ගොස්
ඒ දණ්ඩෙන්
එගොඩ වෙලා
කඳු නැගලා කඩුලු පැනලා
මී හාමිලා හතර දෙනා
කුකුල්හාමි සොයා යතෙයි.

**2 වැනි මීයා** අන්න අතන පේන
ගෙදර වෙන්ටැ
කුකුල් හාමි ඉන්නෙ
(සියල්ලෝ ම කුකුල් හාමිනේ ගේ දෙස එබී බලා)
දොර නම් වසා ඇත.
ගෙයි පිට ගොස් වත්ද?

**1 වැනි මීයා** මිදුලෙ තියෙන මල් පාත්තියෙ
හරි ලස්සන මල් පිපිලා
ඒ අය හරි සිරියාවයි
තොරතුරු දැන ගත හැකි වෙයි.
(මීයෝ මල් පාත්තිය වෙතට ගොස්)
ලස්සන මල් කුමරුනේ
ලස්සන මල් කුමාරියනේ
උදව් සොයා අපි එන්නේ
කුකුල් හාමි
කොයි ඉන්නේ?

**මල් පාත්තිය** එන්න,එන්න
මෙහේ එන්න
කුකුල් හාමි
මෙහෙයි ඉන්නෙ.

**මීයෝ** අපි ආවේ උදව් ගන්න
ඉන්න කන්න
සොයා ගන්න
කුකුල් හාමි
හරි හොඳයිලු
උදව් දෙන්න හරි කැමතිලු.

**මල් පාත්තිය** අපොයි කුකුල් හාමි අගෙයි
උදව් දෙන්න කැමති තමයි
දඟ නොකරන හොඳ ළමයින්
බලා ගනියි හොඳ සතුටින්.

**එක් මලක්** ගෙයි ඉන්නව කුකුල් හාමි
ගොහින් කතා කර බලන්න.

**මීයෝ** කිට්ටු කරලා දොර ළගටා

**සියල්ලෝ ම** තට්ටු කරලා බැලු කලටා
දැන ගත හැකි කුකුල් හාමි
ඉන්නවා ද නැද්ද කියලා.
(එකිනෙකා පසු බසිමින්)
කවුදැයි කවුදැයි
ඉස්සර වෙන්නේ?
ඉස්සර ගොස් දොර
තට්ටු කරන්නේ?

**4 වැනි මීයා** මං නං නෑ ඕං
ඕව කරන්නේ.

**1 වැනි මීයා** වෙන නුවණක් ගැන
සිතා බලන්නේ.
(කුකුල් හාමි එළියට එයි)

**මලක්** එච්චර කරදර මොකටද?
කුකුල් හාමි අර එන්නේ
ගොහින් කතා කර බලන්න.
(කුකුල් හාමි වටපිට බලයි.)

**මීයෝ** ආයුබෝවන් කුකුල් හාමි!

**සියල්ලෝම**

**කුකුල් හාමි** ආයුබෝවන් පොඩි දරුවෙනි ,
ඉතිං මොකද මේ පැත්තේ
ඇයි ද කතාවක් නැත්තේ?

**මීයෝ** කුකුල් හාමි මේ අහන්න
නැතෙයි අපට
කන්න බොන්න
නැතෙයි අපට නිදා ගන්න
අනුකම්පාවක් කරන්න
අපට කන්න
ඉන්න දෙන්න
කුකුල් හාමි කියන වැඩක්
අපගෙ ඇහැට
පෙනෙන වැඩක්
කර දී අප උදව් වෙන්න
අනුකම්පාවක් කරන්න.
අපට කන්න ඉන්න දෙන්න.

**කුකුල් හාමි** හුරුබුහුටියි මේ පැටවුන්
අහිංසකයෝ වගේ පෙනෙයි
මගේ පාළුවටත් එක්කල
ඉඳුම් හිටුම් දීම හොඳයි.
සැමදා ඉස්කෝලෙ යන්ට
පොතපත පාඩම් කරන්න
ලියනු කියනු ඉගෙන ගන්ට
හොඳ කීකරුවට හිඳින්ට
කැමති ළමයි ඉන්නව නම්
කැමතියි මම ඉන්ට දෙන්න
කැමතියි මම කන්ට දෙන්න.

**පිරිස** අසරණ පැටවුන්ට ඉතින්
නැති හන්දා යන්ට තැනක්
නැති හන්දා කන්ට දෙයක්
කුකුල් හාමි දුක හිතිලා
ඉඳුම් හිටුම් දුන්නා.
(පිරිස ගායනා කරන විට නළුවෝ නටති. අභිරූපණය කරති.)
අතුරු මිතුරු දඹදිවතුරු
රාජ කපුරු සෙට්ටියා//
හතර දෙනා දගකාරයි
කතුර වගේ කට සූරයි





නිතර වගේ සෙල්ලමෙන් ම
දවස ගත කළා
උදෙන්ම පාසැලට ගියේ
සවසට සෙල්ලම් පිටියේ
පොතපත මුල්ලක වූයේ
පොරොන්දු අමතකව ගියේ
කුකුල් හාමි කියපු වැඩක්
උන්ගේ ඇහැට
පෙනුණු වැඩක්
කරලා උන් උදව් වුණේ
නෑ පොරොන්දු
අමතක නේ
හතර දෙනා දගකාරයි
බෝලේ පිත්ත අතේ තමයි
නිතර වගේ සෙල්ලමෙන්ම
දවස ගත කළේ
ගෙදර දොරේ
වැඩ ඔක්කොම
කුකුල් හාමි අතේ තමයි
හතර දෙනා නම් කිසි විට
උදව් කළේ නෑ.
(කුකුල් හාමි අභිරූපණය කරයි.)
කුකුල් හාමි
උදෙන් නැගිට
මුළු ගමටම
වෙලාව දී
ඩාං ඩාං ඩාං ඩාං ඩාං ඩාං ඩාං ඩාං
ගෙදර දොරේ
කටයුතු ගැන
කම්මැළි නෑ
කඩිසර වෙයි//
කෑම පිහලා කුකුල් හාමි
ගේ අතු ගා කුකුල් හාමි
ඉදල අරන් කුකුල් හාමි
මිදුලට බැස්සේ දවසක්//

**මල් පාත්තිය** කුකුල් හාමි
කොක්! කොක්! කොක්!
පිදුරු මඩුව
අතුගාන්නේ.

**කුකුල් හාමි** මොකක් බොලේ
චක්! චක්! චක්!

බිම වැටිලා තියෙන්නේ
වී කරලක්!
හොඳට පැහුණු
රන්වන් වූ
වී කරලක්!
වී ටික කොටලා ගත්තොත්
පිටි කොටලා කැවුම් සදා
පුංචි උන්ට
කන්න ඇහැකි.
(මීයන්ට අඬ ගසා)
මෙහෙ වරෙල්ලා දරුවනේ
මේ වී කරලත් ගෙනේ
මෝලට ගොස් කඩිනමේ
කොටා ගෙනෙල්ලා

**1 වැනි මීයා** ගෙදර වැඩක් අල්ලල නෑ
ගණන් හදාගෙන
නොගියොත්
දෙවි පිහිටයි මට!

**2 වැනි මීයා** ලංකාවේ සිතියමකුයි
ගංගාවල් වරායවල්
ඇඳ ගෙන යන්නට
ඇත මට

**3 වැනි මීයා** මගේ ඔළුව
කැක්කුම වගේ
බඩත් ටිකක් රිදෙනවා!

**4 වැනි මීයා** කෝ මාගේ වයලීනය
පුරුදු වෙලා
නොගියෝතින් ....!

**කුකුල් හාමි** හා හා මට තේරෙනවා
කාටත් හරියට වැඩ බව
හොඳයි කාටවත් බැරි නම්
මම ම කොටා ගෙන එන්නං.

**පිරිස** කම්මැලි නෑ
කුකුල් හාමි
වී කරලත් මල්ලක දා
වී කොටලා එන්ට යතෙයි
මී පැටවුන් දඟකාරයි
හිත සැම විට සෙල්ලමටයි
කුකුල් හාමි ගෙදරින් පිට
ගියොත් සෙල්ලමේ ම තමයි.

**මී හාමිලා** කුකුල් හාමි එන්ට
කලියෙන් අපි
බෝල අතක්වත්
සෙල්ලම් කරමුද?
හරි හරි
මෙන්න බෝලෙ
මෙන්න පිත්ත
මමයි බෝල්
මමයි බැටිං
හරි හරි.

**පිරිස** හතර දෙනා දඟකාරයි
කතුර වගේ කට සූරයි
පාඩම් වැඩ කොහොම වුණත්
සෙල්ලම දන් හරි සාරයි.

**මී හාමිලා** කුකුල් හාමි අර එන්නේ
වී ටික කොටලා එන්නේ
හංගපල්ලා බෝලේ පිත්ත
හංගපල්ලා බෝලේ පිත්ත.

**1 වැනි මීයා** පාඩම් පොත අරගන්නේ.

**2 වැනි මීයා** සිතියම් පොත මම ගන්නේ.

**3 වැනි මීයා** බඩ අල්ලං මම ඉන්නේ.

**පිරිස** දඟ කළ බව පුංචි එවුන්
ඇත තියා දුටුව නමුත්
කුකුල් හාමි කරුණාවයි
බැණුම් බසක්
ඔහේ නැතෙයි.

**කුකුල් හාමි** මෙන්න හාල් මං ගෙනාවා
කැවුම් කන්න
ආසා කෙනෙක්
එන්න ඇවිත්
පිටි කොටන්න.

**මී හාමිලා** 1. මම කවි පාඩම් කරනවා!
2. සිතියම් ඇඳ ඉවර නැතේ!
මට තව වැඩ ගොඩක් ඇතේ!
3. මගේ ඔළුව කැක්කුම වගේ!
බඩත් තවම රිදෙනවා!
4. සා......රි........ගා....ම!

**කුකුල් හාමි** ඔව්! ඔව්! මට තේරෙනවා
කාටත් හරියට වැඩ බව
ඉතින් කාටවත් බැරි නං
ඒකත් මං කොටන්නංකෝ.

**පිරිස** ඩෝං ඩෝං

පිටි කොටපං//
සුරුං සුරුං පිටි හලපං//
පිටි කොටලා පිටි හලලා
කුකුල් හාමි හඬලනවා//

**කුකුල් හාමි** පිටි කොටලා පිටි හලලා
සුදට සුදේ බලපල්ලා
කැවුම් කන්න ආස කෙනෙක්
කැවුම් උයා කාපල්ලා.

**1 වැනි මීයා** අපේ අප්පෝ තෙල් තාච්චිය
පෙරළුණොතිං මම ඉවරයි!

**2 වැනි මීයා** ගින්දර අල්ලන්න එපා
අපෙ අම්මා මට කිව්වා!

**3 වැනි මීයා** කැවුම් කන්න පණු ගායට
පුංචි උන්ට හොඳ නැහැල්ලු!

**4 වැනි මීයා** මම නැහැ පැණි රහට කැමති!

**කුකුල් හාමි** හොඳයි කාටවත් බැරි නං
කැවුම් ටිකත් උයන්නංකො.

**පිරිස** පිටිත් කොටා ගෙන
පැණිත් සොයා ගෙන
තෙලුත් සොයා ගෙන
දරත් සොයා ගෙන
ලිප හදලා තාච්චියේ
බැවුම් ඉදෙන්නේ
චෝස් චෝස් චිරි චිරි
කැවුම් ඉදෙන්නේ
තරිකිට කැවුම් ඉදෙන්නේ.

**1 වැනි මීයා** හරි සුවඳයි!

**2 වැනි මීයා** අම්මප ඔව්!

**3 වැනි මීයා** පිගන් ගෙනෙල්ලා
පිගන් ගෙනෙල්ලා
කැවුම් කන්ට අපි
යන්ට වරෙල්ලා//

**සියල්ලෝම** තක්කිට තරිකිට තරිකිට
කැවුම් ඉදි ඇතෙයි.
පිගාන පිරිලා
කැවුමෙන් මේසය උඩ වෙයි.
අම්මගෙ කොණ්ඩය වගේ ම
ඒ කොණ්ඩය වෙයි.
අපටත් කැවුමක් කන්නට
සිකුරට ලැබෙතෙයි.

**පිරිස** ඉවසුම් නෑ මී පැටවුන්ට
සුවඳ කැවුම් රස කර කන්ට
කුකුල් හාමි එය දැන හොඳට
සිටි ඒ වග නො දැණුන ලෙසට

**1 වැනි මීයා** කුකුල් හාමි කරුණාවයි
අප ගැන අනුකම්පාවයි
කැවුම් උයා මහන්සියිද?
කැවුම් හොඳට පදම් වීද?

**කුකුල් හාමි** අපොයි ඒක සුළු වැඩක්නෙ
කැවුම් පිහුම් සෙල්ලමක්නෙ
මේ ළමයින් හට නැතේ
නිවාඩුවක් සෙල්ලමකට.

**මීයෝ** ඒක හැබැයි කුකුල් හාමි
පොතේ පතේ වැඩ
බොහොමයි
ගුරුතුමා ද බොහොම වසයි
ගෙදර වැඩත් නිතර තිබෙයි.

**කුකුල් හාමි** ඔව් ඔව් මම නො දන්නවාද?
ඔව් ඔව් මම නො දුටුවාද?
හොඳ කීකරු මේ ළමයින්
පාඩම් කළ හැටිය හොඳින්
පොතේ පතේ වැඩ කරලා
සංගීතය හුරු වීලා
ඉස්කෝලෙට පේ වීලා
මහන්සි ඇති නේද ළමයි?

**මීයෝ** අපොයි අපට හරියට වැඩ
ගෙදර දි කර ගෙන යන්නට
ගුරුතුමාට පෙන්නන්නට
ඉස්කෝලෙට ගියා ම හෙට

**කුකුල් හාමි** මේ කැවුම් හරි රසයි......

**මීයෝ** ඔව්!

**කුකුල් හාමි** ඒ වගේ ම හරි හැඩයි........

**මීයෝ** ඔව්!! ඔව්!!

**කුකුල් හාමි** හරි ම හරි සුවඳයි....

**මීයෝ** ඔව්!!! ඔව්!!! ඔව්!!!

**කුකුල් හාමි** කටටත් කෙළ උනනවා..........

**මීයෝ** ඔව්!!! ඔව්!!! ඔව්!!!

**කුකුල් හාමි** කවුද යි කවුදයි කරල ගෙනාවේ?

**මීයෝ** කුකුල් හාමි නොවැ කරල ගෙනාවේ?
රන්වන් ඒ වී කරල ගෙනාවේ.

**කුකුල් හාමි** කවුදයි වී ටික කොටලා ගෙනාවේ?

**මීයෝ** (ඉතා උද්යෝගිමත්ව)

කුකුල් හාමි නොවැ
කොටලා ගෙනාවේ.
මෝලට ගොස් වී
කොටලා ගෙනාවේ.

**කුකුල් හාමි** කවුදැයි ඉන් පිටි කොටලා ගත්තේ?

**මීයෝ** කුකුල් හාමි නෙවැ
කොටලා ගත්තේ.
කොටාපු පිටිටික හලලා ගත්තේ.

**කුකුල් හාමි** කවුද කැවුම් ටික උයලා ගත්තේ?
(පසු බසිමින්)

**මීයෝ** කුකුල් හාමිමයි උයලා ගත්තේ.

**කුකුල් හාමි** කවුද කැවුම් ටික කන්නට ඕනෑ?

**මීයෝ** (පරාජිතව) කුකුල් හාමිමයි කන්නට ඕනෑ.

**පිරිස** වී කොටන්න බෑ.
පිටි කොටන්න බෑ.
(මීයෝ ආපසු හැරී යති.)
කිසිම වැඩක් බෑ.
ඉතින් කැවුම් කන්ට බෑ.

**කුකුල් හාමි** හා හා හා දරුවනේ
යන්ට එපා දරුවනේ
අදට කැවුම් කාපල්ලා
නමුත් මේක අහපල්ලා
මේ ලෝකේ කවුරු නමුත්
වැඩපළ නොකරනවා නම්
නිකම් ඔහේ පුටු පිට ඉඳ
කන්ට හොඳත් නෑ.

**සියල්ලෝම** පුංචි අපට දූන් තේරෙයි//
පුංචි පුංචි ඔළු එකතු ව
පුංචි පුංචි අත් එකතුව
පුංචි අපට ලොකු දේවල්
කරන්ට බැරි නෑ//
මේ ලෝකේ කවුරු නමුත්
වැඩපළ නොකරනවා නම්
නිකම් ඔහේ පුටු පිට ඉඳ
කන්ට හොඳත් නෑ
පුංචි අපට දූන් තේරෙයි!
පුංචි අපට දූන් තේරෙයි!!



